**රුසියානු ආරක්ෂක උපදේශක රාජ්‍ය අමාත්‍යතුමන් හමුවෙයි**

ශ්‍රී ලංකාවේ රුසියානු තානාපති කාර්යාලයේ ආරක්ෂක උපදේශක කර්නල් දිමිත්‍රි නිකලුස්කි *(Colonel Dimitry Nikhaylouskiy)* මහතා අද (ජූලි 10) දින ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය රුවන් විජයවර්ධන මැතිතුමන් අමාත්‍යංශ පරිශ්‍රයේදී හමුවිය.

මෙහිදී රාජ්‍ය අමාත්‍ය විජයවර්ධනයන් සහ කර්නල් නිකලූස්කි මහතා අතර සුහද සාකච්ඡාවක් පැවැත්විණි. මෙම අවස්තාව සිහිවීම පිණිස දෙපාර්ශවය අතර සමරු තිළිණ හුවමාරුවක්ද සිදුවිය.